## 2023-10-02 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ජාතික ආරක්ෂාව සඳහා බලපානු ලබන රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම

කාර්මික, කෘෂිකාර්මික, වෛද්‍ය සහ පර්යේෂණ කටයුතු වැනි සාමකාමී කාර්යයන් සඳහා විවිධ රසායනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙරට තුළ භාවිතා කරනු ලබයි. ඒ අතුරින් නයිට්‍රික් අම්ලය, ක්ලෝරීන්, හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්, පොටෑසියම් සයනයිඩ්, සෝඩියම් සයනයිඩ්, නයිට්‍රොමෙතේන් සහ සෝඩියම් ඒසයිඩ් වැනි රසායනික ද්‍රව්‍ය සාමකාමී භාවිතයට මෙන්ම නීත්‍යානුකූල නොවන කටයුතු සඳහා ද යොදා ගත හැකි ද්විත්ව භාවිත ස්වභාවයෙන් යුක්ත බව නිරීක්ෂණය වී ඇත. කිරි, බීම වර්ග, තෙල් ආශ්‍රිත කර්මාන්ත, ජලය පිරිසිදු කිරීම වැනි විවිධ කර්මාන්ත රාශියක් සඳහා භාවිත කරන එම රසායනික ද්‍රව්‍ය ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන අනර්ථකාරී කාර්යයන් සඳහා ද භාවිත කිරීමේ අවදානමක් පවතින බව හඳුනාගෙන තිබේ. එබැවින්, එවැනි රසායනික ද්‍රව්‍ය අවභාවිත කිරීම වැළැක්වීම සඳහා ඒවා නියාමනය කිරීමට නීතිමය විධිවිධාන පැනවීමටත්, එකී නියාමන කාර්යභාරය රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය වෙත පැවරීමටත් ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල මණ්ඩප බවට වැඩිදියුණු කරමින් අධ්‍යාපනය පිළිබඳ විශ්වවිද්‍යාලයක් පිහිටුවීම

ශ්‍රී ලංකාවේ සමස්ත ගුරු ප්‍රජාවම උපාධිධාරීන් බවට පත් කිරීමේ අරමුණින් දැනට ක්‍රියාත්මක ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ තත්ත්වයට උසස් කිරීම සඳහා අනුගමනය කළ යුතු පරිපාලන හා නෛතික ක්‍රමවේදය පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස 2019-12-04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් විශේෂඥ කමිටුවක් පත් කරනු ලැබ ඇත. එකී කමිටුවේ නිර්දේශ පරිදි දැනට පවතින ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 20න් 19ක් විශ්වවිද්‍යාල මණ්ඩප වශයෙන් උසස් කිරීමට සහ ශ්‍රී ලංකා අධ්‍යාපන විශ්වවිද්‍යාලය නමින් නව විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදාළව නීතිමය විධිවිධාන පැනවීම සඳහා නව පනත් කෙටුම්පතක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා රජයේ ඉඩම් බදු පදනම මත ලබා දීම**

මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි හෙක්ටයාර 219.72ක පමණ ඉඩම් ප්‍රමාණයක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත පවරා ගැනීම පිණිස වන යෝජනාව 2023-08-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලද අතර, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඒ සම්බන්ධ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවට තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ නිර්දේශ මත අදාළ ඉඩම් ප්‍රමාණය තෝරාගනු ලබන පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයා වෙත උප බදු දීමට හැකි වන පරිදි අදාළ විධිවිධාන ද සහිතව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත වසර 25ක කාලයක් සඳහා දිගුකාලීන බදු පදනම මත ලබා දීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබෙන පාරිභෝගික පැමිණිලිවලට අදාළව පවත්වනු ලබන පරීක්ෂණ විධිමත් කිරීම**

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට නෛතික ප්‍රතිපාදන සලසා ඇත. එමෙන්ම, 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත මගින් ස්ථාපිත මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීමේ අරමුණින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා එක්ව වෙළෙඳපොළ වැටලීම් සිදු කරනු ලබයි. ඒ අනුව, පාරිභෝගික පැමිණිලි විමර්ශනය කර එහි තීන්දු ලබා දීමට වැය වන කාලය හා ශ්‍රමය අවම කර ගැනීමේ එක් වැදගත් පියවරක් වශයෙන් පාරිභෝගික අයිතීන් සුරැකීම සහ සාධාරණ වෙළෙඳ පිළිවෙත් සම්බන්ධයෙන් පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් දැනුවත් කිරීමටත්, එකී පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනු ලබන ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම උදෙසා එම කටයුතු විමධ්‍යගත කර දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට විධිවිධාන සැලැස්වීමටත්, විශේෂ වැටලීම් හා සම්බන්ධ කාර්යයන් ඒකාබද්ධ වැඩපිළිවෙලක් මඟින් සිදු කිරීමේ අරමුණින් ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමටත් අදාළව සිය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩපිළිවෙල වෙළෙඳ, වාණිජ හා

ආහාර සුරක්ෂිතතා ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

**05. සීමාසහිත ටෙස් (පුද්ගලික) සමාගම වෙත මත්ස්‍ය පිරිසැකසුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔලුවිල් ධීවර වරාය තුළ පහසුකම් ලබා දීම**

ඔලුවිල් ධීවර වරාය පරිශ්‍රයේ ප්‍රයෝජනයට නොගෙන පවතින මත්ස්‍ය පිරිසැකසුම් යන්ත්‍රාගාරය නැවත සක්‍රීය කරමින් මත්ස්‍ය පිරිසැකසුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා සීමාසහිත ටෙස් (පුද්ගලික) සමාගම වෙත ඔලුවිල් ධීවර වරාය තුළ පහසුකම් ලබා දීම පිණිස මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇති අදාළ බදු කුලිය මාසිකව අය කිරීමට යටත්ව, ඔලුවිල් වරාය සංකීර්ණයේ පිහිටි මත්ස්‍ය පිරිසැකසුම් ඒකකය සීමාසහිත ටෙස් (පුද්ගලික) සමාගම වෙත වසර 10ක කාලසීමාවක් සඳහා බදු පදනම මත ලබා දීම පිණිස ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ජලාශවලට මත්ස්‍ය පැටවුන් මුදා හැරීම මඟින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම**

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය ඉහළ නැංවීම සහ රැකියා/ජීවනෝපාය අවස්ථා සැලසීම සඳහා ඉහළ දායකත්වයක් දක්වයි. මෙරට ජලාශවල ඉහළ වර්ධනයක් සහිත ආර්ථික වශයෙන් ඵලදායී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු කිරීම සඳහා වාර්ෂිකව මත්ස්‍ය පැටවුන් මිලියන 500ක් පමණ නොකඩවා තැන්පත් කළ යුතු වේ. එහෙත්, මත්ස්‍ය පැටවුන් ප්‍රමාණවත් පරිදි තැන්පත් කිරීම සිදු නොවීම හේතුවෙන් වගා පාදක ධීවර කර්මාන්තය සඳහා පවතින ජලාශවල විභවතාව පූර්ණ වශයෙන් භාවිත කිරීමට මෙතෙක් නොහැකි වී ඇත. 2023 වර්ෂයේ මත්ස්‍ය පැටවුන් මිලියන 230ක් සහ ඉස්සන් පසු කීටයන් මිලියන 80ක් ජලාශවල තැන්පත් කිරීමට මූලිකව සැලසුම් කර තිබූ නමුත් පසුගිය කාලයේ පැවති වියළි කාලගුණික තත්ත්වය මත ජලාශ සිඳී යාම හේතුවෙන් එම සැලැස්ම වෙනස් කිරීමට සිදු වී ඇත. ඒ අනුව, එකී සැලැස්ම සංශෝධනය කරමින් මෙම වර්ෂයේ ඉතිරි කාලසීමාව තුළ මත්ස්‍ය පැටවුන් මිලියන 100ක් සහ මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 50ක් පමණ නිෂ්පාදනය කර ජලාශ වෙත මුදා හැරීමේ වැඩපිළිවෙල

ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සලසා ගැනීම පිණිස ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගනිමින් 2023 වර්ෂය සඳහා එම කාර්යයන් වෙනුවෙන් රුපියල් මිලියන 100ක අතිරේක ප්‍රතිපාදන සලසා දීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. නව වාණිජ මහාධිකරණයක් ස්ථාපිත කිරීම**

සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී රට තුළ වඩා යහපත් ආයෝජන වාතාවරණයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගත යුතුව ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාණිජ කරුණු සම්බන්ධයෙන් දැනට පවතින අධික නඩු ප්‍රමාණය කඩිනමින් විසඳා අවසන් කිරීම තහවුරු කිරීම පිණිස නව වාණිජ මහාධිකරණයක් පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, අදාළ වාණිජ මහාධිකරණය කොළඹ 12, අධිකරණ මාවතේ අංක 80 දරන ස්ථානයෙහි ස්ථාපිත කිරීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා චීන රජයේ ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම**

බස්නාහිර පළාත තුළ අඩු පහසුකම් සහිත ජනාවාසවල පදිංචිකරුවන් පුනස්ථාපනය කර පහසුකම් සහිත නාගරික නිවාස යෝජනා ක්‍රමවල නිවාසයන්හි පදිංචි කරවීමට ගත් තීරණය පරිදි ක්‍රියාත්මක නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා සහායක් වශයෙන් නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම පිණිස ශ්‍රී ලංකා රජය වෙත යුවාන් මිලියන 552ක මූල්‍යාධාර ලබා දීමට චීන රජය විසින් එකඟතාව පළ කර ඇත. සමස්ත ව්‍යාපෘතිය යටතේ ඉඩම් සංවර්ධනය කිරීම හා වැඩබිම් සීමාව දක්වා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, චීන රජය සමඟ අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමට අත්සන් තැබීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ගොඩනැංවීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීමේ පදනම මත මෙගාවොට් 1-5 අතර ධාරිතාවයකින් යුත් මෙගාවොට් 70ක් දක්වා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතාව සහිත බලාගාර ස්ථාපිත කිරීම**

ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ නිමැවුම් බල ඒකක මෙගාවොට් 70ක (70MW, AC) ධාරිතාවයකින් යුත් භූමිය මත සවි කළ සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා (Photovoltaic - PV) බලාගාර ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ නිමැවුම් බල ඒකක මෙගාවොට් 1-5 අතර ධාරිතාවයකින් (1-5MW, AC) ගොඩනැංවීමේ, අයිතිය දැරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පදනම මත වසර 20ක මෙහෙයුම් කාලසීමාවක් සහිතව ග්‍රිඩ් උපපොළවල් 11කට සම්බන්ධ කිරීමට හැකි වන පරිදි ස්ථාපනය කිරීම සඳහා උනන්දුවක් දක්වන ආයෝජකයින්ගෙන් යෝජනා කැඳවනු ලැබ ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් අදාළ යෝජනා ඇගයීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව අම්පාර, අනුරාධපුර, ගාල්ල, හබරණ, කුරුණෑගල, මාදම්පෙ, මහව සහ මාතර ග්‍රිඩ් උපපොළවල් 08 සඳහා වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ ආයෝජකයින් වෙත අනුමැතිය ලබා දීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ සඳහා වන මූලික පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් විධිමත් පරිදි පිළියෙල කරනු ලැබ ඇති අතර එකී පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) හි විධිවිධාන පරිදි අදාළ පනත් කෙටුම්පත නිර්දේශ කරමින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සඳහා සංශෝධන**

සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම, සමථ මණ්ඩල බල ප්‍රදේශ සම්බන්ධයෙන් වන විධිවිධාන සංශෝධනය කිරීම හා තවත් අදාළ සංශෝධන කිහිපයක් හඳුන්වා දෙමින් 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස 2023-02-27 දින පැවති

අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. සමථකරණය තුළින් ඇති වන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත් කෙටුම්පත**

එක්සත් ජාතීන්ගේ සමථකරණය තුළින් ඇති වන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම පිළිබඳ සම්මුතිය (සමථකරණය පිළිබඳ සිංගප්පූරු සම්මුතිය) දේශීය වශයෙන් බලාත්මක කිරීමට අදාළව නීති සම්පාදනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 2022-10-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලලිත් එල්ලාවල මහතා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. ඊට අදාළ මූලික පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් විධිමත් පරිදි පිළියෙල කර ඇති අතර ඒ සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6)හි විධිවිධාන පරිදි අදාළ පනත් කෙටුම්පත නිර්දේශ කරමින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 14. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව සඳහා උපදේශක මණ්ඩලයක් පත් කිරීම

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණයක් සහ පසු විපරමක් අවශ්‍ය බැවින්, ඒ සඳහා උපදේශක මණ්ඩලයක් පත් කරන ලෙස 2023-06-09 දින පැවති රජයේ ගිණුම් කාරක සභා රැස්වීමේදී නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වය යටතේ සහ අනෙකුත් අදාළ ආයතන ප්‍රධානීන්ගෙන් සහ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විතව යෝජිත උපදේශක මණ්ඩලය පත් කිරීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*********